Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

# පෙරදිග සංගීතය

**8 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 10 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සප්තකයේ ඇති චල සහ අචල ස්වර ගණන පිළිවෙලින්,

(i) 07 කි, 12 කි. (ii) 05 කි, 02 කි. (iii) 02 කි, 04 කි. (iv) 02 කි, 05 කි.

02 ගීතයක් ආරම්භ කිරීමට පෙර වැයෙන සංගීත ඛණ්ඩය හැඳින්වෙන්නේ,

(i) Melody නමිනි. (ii) Interlude නමිනි.
(iii) Introduction නමිනි. (iv) Verse නමිනි.

03 “දවසක් පැල නැති හේනේ .... ” ගීතයේ සංගීත නිර්මාණය සහ ගායනය සිදු කර ඇත්තේ,

(i) සුනිල් එදිරිසිංහ මහතා ය. (ii) පණ්ඩිත් අමරදේව මහතා ය.
(iii) ගුණදාස කපුගේ මහතා ය. (iv) සුනිල් දයානන්ද කෝනාර මහතා ය.

04 මිශ්‍ර මත් කැටි සහිත තාල පද දෙකකි.

(i) දාදරා, බෙම්ටෝ තාල (ii) ත්‍රිතාල්, කෙහෙර්වා තාල
(iii) ජප්, දීප්චන්දි තාල (iv) ලාවනී,කෙහෙර්වා තාල

05 භජන් ගී යනු,

(i) දක්ෂිණ භාරතීය ගායන ශෛලියකි.
(ii) ඛ්‍යාල් ගායනයේ කොටසකි.
(iii) උත්තර භාරතීය වාදන ශිල්ප ක්‍රමයකි.
(iv) උත්තර භාරතීය සරල ශාස්ත්‍රීය ගායන ශෛලියකි.

- **පහත සඳහන් ගී පාද ඇසුරින් 06 -10 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A උදයට පායන හිරු දෙවියන්ටය.
B තෙල් ගාලා හිස පීරන් නැනෝ
C ඉරු දෙවියෝ වැඩිය තැනේ

06 ABC ගී පාද පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ,

(i) කමත් ගී, ගොයම් ගී, නෙළුම් ගී (ii) ගොයම් ගී, නෙළුම් ගී, කමත් ගී
(iii) නෙළුම් ගී, කමත් ගී, ගොයම් ගී (iv) ගොයම් ගී, කමත් ගී, නෙළුම් ගී

07 ‘අඬහැරය’ සම්බන්ධ වන්නේ,

(i) A ගී පාදයට ය. (ii) B ගී පාදයට ය.
(iii) C ගී පාදයට ය. (iv) මේ කිසිවකටත් නොවේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

08 ඉහත ගී වර්ග අයත් වන්නේ, ජන ගී වර්ගීකරණයේ,

(i) සමාජීය අවශ්‍යතා මත ගොඩනැගුන ගී ගණයට ය.

(ii) යම්කිසි කාර්යයක් (වෘත්තීයක්) මත පදනම් වූ ගී ගණයට ය.

(iii) ඇදහිලි හා විශ්වාස මත ගොඩ නැගුන ගී ගණයට ය.

(iv) සේ ගී ගණයට ය.

09 B ගී පාදය ගැයීම සඳහා යොදාගනු ලබන අවනද්ධ භාණ්ඩයකි.

(i) ගැටබෙරය (ii) දවුල (iii) තම්මැට්ටම (iv) බුම්මැඩිය

10 මෙම ගීත තුනමට අදාළ පොදු ලක්ෂණයක් වන්නේ,

(i) ගී වර්ග තුනම ගායනා කරනු ලබන අවස්ථා එක සමාන වේ.

(ii) මෙම ගීත පොත්පත්වල සඳහන් වේ.

(iii) මෙම ගීත සේ ගී ගණයට ගැනේ.

(iv) මෙම ගීත ගැමි ගී ගණයට ගැනේ.

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා නිවැරදි පිළිතුරු සඳහා A හා B තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 11 | තබ්ලාව | මූදු පුත්තු නාට්‍යය |
| 12 | A. R. රහ්මන් | නාඩගම් |
| 13 | මද්දලය | නූර්ති |
| 14 | ගුණසේන ගලප්පත්ති | චින්න චින ආසෙයි |
| 15 | මිස්රාබය | සිතාරය |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ඇති ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

16 නාඩගම් නාට්‍ය ශෛලිය මෙරටට හඳුන්වා දුන්නේ ............................................. සංගීතඥයෙකු වන

17 ........................................................................................ විසිනි.

18 බටහිර සංගීත ස්වර ප්‍රස්ථාරකරණයේ දී භාවිත වන 𝅗𝅥. (Dotted minim) සංකේතයේ වටිනාකම මාත්‍රා .............................................. කි.

19 බිලාවල් රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් වන්නේ ...................................................................... ගීතයයි.

20 යතිය සහිත පැදි ................................................................................. වේ.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 02 ක් තෝරාගෙන ප්‍රශ්න 03 කට නිවැරදි පිළිතුරු සපයන්න.**

01
- උත්තර භාරතීය සංගීතය
- උරුට්ටුව භාවිතය
- දොහොරාව භාවිතය
- චාර්ල්ස් ඩයස් මහතා
- පිළිප්පු සිඤ්ඤෝ
- අඹ දඹ නාරං කෙසෙල් දෙල්
- දක්ෂිණ භාරතීය සංගීතය
- අඩුතාල වැඩිතාල වාදනය

ඉහත දක්වා ඇත්තේ විෂය නිර්දේශයට අදාළ නාට්‍ය ශෛලීන් දෙකක තොරතුරු වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(i) මෙම නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න. (ල. 2)

(ii) මෙම තොරතුරු ඔබ නම් කල නාට්‍ය ශෛලීන් දෙකට අදාළව වෙන් කරන්න. (ල. 2)

(iii) ඉහත නාට්‍ය ශෛලීන් දෙකට අයත් ඔබ දන්නා තවත් කරුණු දෙක බැගින් ලියන්න. (ල. 4)

(iv) ඉන් එක් නාට්‍ය ශෛලියකට අදාළව ගීතයක් ලියන්න. (ල. 2)

02 (i) "කොබෝ කුරුලු වනේ.... " මෙම ගී පාදයෙහි ඇති සදෑස්මක් හා ගී මත් ගනනය කර ලියන්න. (ල. 2)

(ii) යතිය යනු නිර්වචනය කරන්න. (ල. 2)

(iii) යතියේ ප්‍රභේද 02 ක් නම් කරන්න. (ල. 2)

(iv) සයති පැදියකට සහ නියති පැදියකට උදාහරණය බැගින් ලියන්න. (ල. 2)

(v) "තෙල් මල් පහන් සුවඳ දුම් සඳුනෙන් පුදන්නෝ" .......
ඉහත පද පේළියෙහි ඇතුලත් ලඝු සහ ගුරු අක්ෂර වෙන්කර ගනනය කර ලියන්න. (ල. 2)

03 ස රි ග | රි ග - | ම ග රි | ග ස -
ප ම ග | ම ග රි | ස - - | රි ග -

(i) ඉහත ස්වර ප්‍රස්ථාරය රේඛා මණ්ඩලය මත බටහිර ක්‍රමයට ප්‍රස්ථාර කරන්න. (ල. 4)

(ii) පහත සඳහන් සංකේත ලකුණු කර ඒවාට හිමි මාත්‍රා වටිනාකම් ඒ ඉදිරියෙන් ලියන්න. (ල. 2)
සෙමිබ්‍රිව් - Semi breve
ක්‍රොට්චට් - Crotchet
මිනිම් - Minim
ඩොටඩ් මිනිම් - Dotted minim

(iii) රේඛා මණ්ඩලය මත ශුද්ධ ස්වර සප්තකය සෙමිබ්‍රිව් සලකුණ යොදාගනිමින් ලකුණු කරන්න. (ල. 2)

(iv) හින්දුස්ථානි සංගීතයේ ත්‍රිතාලයට අයත් බටහිර තාලය නම් කරන්න. (ල. 2)

04 (i) ගැමි ගීත තුල දැකිය හැකි ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 3)

(ii) කෙත හා බැඳි ජන ගී වර්ග 03 ක් නම් කරන්න. (ල. 3)

(iii) ඉහත ගී වර්ග තුනෙන් එක් වර්ගයකට අයත් ගීතයක් ලියන්න. (ල. 2)

(iv) "බෝගම්බර අපි නෙළුමට යනකොට" ......
1. ඉහත ගී පාදය කුමන ගී වර්ගයකට අයත් ද?
2. එම ගී වර්ගය ගායනා කරන්නේ කුමන අවස්ථාවකදී ද? (ල. 2)

05 (i) උත්තර භාරතීය සරල ශාස්ත්‍රීය ගීතයක මුල් ගී පාදය ලියන්න. (ල. 1)

(ii) එම ගායන ශෛලිය පිළිබඳ ඔබ දන්නා කරුණු 03 ක් ලියන්න. (ල. 3)

(iii) පහත දැක්වෙන්නේ සරල ගීතයක කොටස් කිහිපයකි. එම කොටස් අතරින් 02 පිළිබඳව විස්තර කරන්න.
1. Introduction
2. Interlude
3. Chorus
4. Verse
5. Counter part (ල. 4)

(iv) ''සරල ගීතයක බස සහ ආකෘතිය'' යන පාඩමේ දී ඔබ ශ්‍රවණය කරන ලද සරල ගීතය සඳහා යොදාගත් සංගීත භාණ්ඩ 04 ක් නම් කරන්න. (ල. 2)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | ii | 06 | ii | 11 | නූර්ති | 16 | කර්ණාටක |
| 02 | iii | 07 | iii | 12 | චිත්ත චින ආසෙයි | 17 | අලගනායිදු |
| 03 | iii | 08 | ii | 13 | නාඩගම් | 18 | 3 |
| 04 | iii | 09 | iv | 14 | මුදු පුත්තු නාට්‍ය | 19 | සිරස නමමු මව් පොළවට |
| 05 | iv | 10 | iv | 15 | සිතාරය | 20 | සයති පැදි |

## II කොටස

01 (i) නූර්ති නාඩගම් (ල. 02)
(ii) නිවැරදිව වෙන් කර ඇත්නම් (ල. 02)
(iii) ගීතය සඳහා (ල. 02)
(iv) එක් කරුණකට එක බැගින් කරුණු 04 ට (ල. 04) (මුළු ලකුණු 10)

02 (i) සඳැස්මත් - 9 ගී ක් - 12 (ල. 02)
(ii) නිවැරදි නිර්වචනය සඳහා (ල. 02)
(iii) ප්‍රභේද 02 ක් සඳහන් කිරීමට (ල. 02)
(iv) උදාහරණ 02 සඳහා (ල. 02)
(v) ලඝු - 7 ගුරු - 7 (ල. 02) (මුළු ලකුණු 10)

03 (i)



(ල. 04)

(ii) සෙමිබ්‍රිව් - 𝅝 - 4 ක්‍රොට්චට් - ♩ - 1
මිනිම් - 𝅗𝅥 - 2 ඩොටඩ් මිනිම් - 𝅗𝅥. - 3 (ල. 03)
(iii) නිවැරදිව ලකුණු කර ඇතිවිට (ල. 02)
(iv) 4/4 (ල. 02) (මුළු ලකුණු 10)

04 (i) අදාළ ලක්ෂණ නිවැරදිව ලියා ඇත්නම් (ල. 03)
(ii) වර්ග 03 සඳහා (නෙළුම්, කමත්, ගොයම්) (ල. 03)
(iii) ගීතය සඳහා. (ල. 02)
(iv) නිවැරදි පිළිතුර සඳහා (ල. 02) (මුළු ලකුණු 10)

05 (i) ගී පාදය ලිවීම සඳහා (ල. 01)
(ii) කරුණු තුනක් සඳහන් කිරීම. (ල. 03)
(iii) නිවැරදිව විස්තර කර ඇත්නම් (ල. 04)
(iv) සංගීත භාණ්ඩ 04 නම් කිරීමට (ල. 02) (මුළු ලකුණු 10)

සැ.යු. :- පළමු කොටසට ලකුණු 20
දෙවන කොටසට ලකුණු 30
ප්‍රායෝගික පරීක්ෂණයට ලකුණු 50